" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092500; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

සාමාන්‍ය දුරකථන / பொதுவான தொலைபேசி / General Telephone } 011 - 2092000

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/ADM/18-87/FI/01-01 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } දිනය / திகதி / Date } 2022.03. 08

ප්‍රධාන ලේකම් කාර්යාලය (53) 08 MAR 2022 බස්නාහිර පළාත

ලේකම්,

(පළාත් පාලන/ අධ්‍යාපන/ සෞඛ්‍ය/ ප්‍රවාහන/ කෘෂිකර්ම)අමාත්‍යාංශය (බ.ප.),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්,

(පාලන/ මූල්‍ය/ පිරිස් හා පුහුණු/ සැලසුම්/ ඉංජිනේරු)

බස්නාහිර පළාත.

**<u>ගෘහස්ථ මට්ටමින් එක්රැස් කරන ලද භාවිතා කළ මුහුණු ආවරණ ආරක්ෂිතව බැහැර කිරීම සඳහා අතුරු මාර්ගෝපදේශකය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/15/3/පොදු හා 2022.02.10 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින් යොමු කර ඇති ගෘහස්ථ මට්ටමින් එක්රැස් කරන ලද භාවිතා කළ මුහුණු ආවරණ ආරක්ෂිතව බැහැර කිරීම සම්බන්ධව පරිසර අමාත්‍යාංශය මගින් සකස් කරන ලද අතුරු මාර්ගෝපදේශකයේ පිටපතක් ඔබගේ දැනුවත් වීම සහ අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

PO
Pl circulate
10/03/2022



| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதம உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |



Scanned with CamScanner

**ගෘහස්ථ මට්ටමින් එක්රැස් කරන ලද භාවිත කල මුහුණු ආවරණ ආරක්ෂිතව බැහැර කිරීම සඳහා අතුරු මාර්ගෝපදේශය.**

**හැඳින්වීම**

වර්තමානයේදී මහජනතාව විසින් භාවිත කල මුහුණු ආවරණ අනෙකුත් රටවල මෙන් සාමාන්‍ය කසල බැහැර කරනු ලබන ආකාරයටම අදාල පළාත් පාලන ආයතන හරහා බැහැර කරනු ලබයි. සමහර අවස්ථා වල භාවිත කළ මුහුණු ආවරණ අක්‍රමවත් ලෙස ජල මාර්ග, වෙරළ , වනාන්තර හා අභය භූමි වැනි පරිසර සංවේදී ප්‍රදේශයන් ද අතුලත්ව පොදු ස්ථානවලටද ජනතාව විසින් බැහැර කරනු ලබයි. පරිසරය ආරක්ෂා කිරීම හා සෞඛ්‍යය රැක ගැනීම සඳහා මෙම ක්‍රියාවලිය මනාව ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ.

එම නිසා, සෞඛ්‍ය රැකගැනීමේ ආයතන හා අතරමැදි මධ්‍යස්ථාන සතුව දැනටමත් නම් කරන ලද ක්‍රමයන් පවතින අදාල පළාත්පාලන ආයතන හරහා අක්‍රමවත් බැහැර කිරීම් අධෛර්යමත් කිරීම හා වර්ථමාන බැහැර කිරීම ක්‍රියාවලිය මනා ලෙස ක්‍රියාත්මක කිරීම ඉතා හදිසි අවශ්‍යතාවක් වේ.

ප්‍රජාව විසින් භාවිත කරනු ලැබූ මුහුණු ආවරණ වල විභව්‍ය අවධානම සැලකිල්ලට ගෙන, බැහැර කිරීමට පෙර භාවිත කළ මුහුණු ආවරණ විභව්‍ය ආසාදනකාරී නොවන ලෙසට කටයුතු කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ගයන් පහත මාර්ගෝපදේශය මගින් සපයනු ලබයි.

**භාවිත කල මුහුණු ආවරණ නිසි පරිදි බැහැර කිරීම සඳහා වන මාර්ගෝපදේශය.**

මෙම මාර්ගෝපදේශය කසල කළමණාකරනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය (2019), නියෝග හා ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති නමුත් වර්ථමානයේ පවත්නා කොවිඩ්-19 සෞඛ්‍ය හදිසි අවස්ථාවේ විශේෂිත අවශ්‍යතාවයන් වලට මුහුණ දීම සඳහා විධිවිධාන සහිතව සකසා ඇත. ආදාල පළාත් පාලන ආයතන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනයන්හී මහ පෙන්වීම යටතේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය අමාත්‍යාංශය පරිසර අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් දෙන සම්පත් හා උපදෙස් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසන කාර්ය භාර ආයතන වේ.

සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම පරිසර අමාත්‍යාංශය තවදුරටත් දැන්වීම් නිකුත් කරන තෙක් මෙම මාර්ගෝපදේශය භාවිත කළ යුතුය.

1. **කොටස - මහජනතාව සඳහා සාමාන්‍ය උපදෙස්**

1.1 කිසිම පුද්ගලයෙක් විවෘතහෝ අත්හරින ලද ඉඩම්, මහාමාර්ග, පදික වේදිකා, පිට්ටනි, ජල කාණු, ඇවිදින මං තීරු, පොදු වාහන හා බස් නැවතුම්පොල, දුම්රිය ස්ථාන, වනාන්තර හෝ අභයභූමි වැනි ස්ථාන වලට මෙම භාවිත කල මුහුණු ආවරණ බැහැර කිරීම නොකල යුතුයි. පළාත් පාලන ආයතන මගින් කසල එකතු කිරීමේ සේවාවන් සිදු නොකරන නිවෙස් පහත සඳහන් විකල්ප ක්‍රමයන් හරහා මුහුණු ආවරණ බැහැර කිරීම කළයුතුය.

2. **කොටස - ගෘහස්ථයන් සඳහා විශේෂ උපදෙස්**

2.1 කසල වෙන් කිරීම, රැස් කිරීම හා භාරදීම

නිරෝධායනය වන නිවෙස් හෝ කොවිඩ් 19 ආසාදිතයන් සහිත නිවෙස් ඇතුලත්ව සියළු ගෘහයන් වල පදිංචිකරුවන් භාවිත කළ මුහුණු ආවරණ පොලිතීන් බෑගයක් තුළට දමා ඒවා ප්ලාස්ටික් බඳුනකට වෙනම එක්රැස් කළයුතු අතර, එම බඳුන වසා ඇති බවට වග බලා ගත යුතුය.

Scanned with CamScanner


2.1.2 භාවිත කළ මුහුණු ආවරණ පොලිතින් බෑගවලට දැමීමට පෙර, කණට දමනු ලබන පටි ඉවත්කර යුතුය. පසුව ඉක්මණින් හොඳින් සබන් ගා අත් ජලයෙන් සේදිය යුතුය.

2.1.3 පොලිතින් බෑගයෙන් ¾ක් පමණ පිරුණු පසු බෑගය තද පටියකින් මනාලෙස ගැට ගසා තවත් පොලිතින් බෑගයක් තුලට දැමිය යුතුය. පසුව ඉක්මණින් හොඳින් සබන් ගා අත් ජලයෙන් සේදිය යුතුය.

2.1.4 මෙම බෑගය ළමයින් හා සතුන්ට ළඟා විය නොහැකි සේ නිවසේ ආරක්ෂිත ස්ථානයක දින 03ක් පමණ තබා ගන්න. දින 03කට පසු අනෙක් ඉවත් කරන පිළිස්සිය හැකි කසල සමග අදාල පළාත් පාලන ආයතනයට බාර දෙන්න.

<u>1වන ගැලීම් සටහන</u>

කසල එක්රැස් කිරීමේ සේවාවන් සපයන පළාත් පාලන ආයතනයේ ගෘහයන් සඳහා ක්‍රියාකාරී ගැලීම් සටහන




2.1.6. පළාත් පාලන ආයතන විසින් කසල එක් රැස් කිරීමේ සේවාවන් සපයනු නොලබන නිවෙස්වල කසල බඳුන් දින 03ක් (පැය 72)ක් තබා ගතයුතු අතර ඔවුන්ගේ පරිශ්‍රය තුල සුදුසු ස්ථානයක හාරන ලද වලක කසළ වැලලිය යුතුය.

Scanned with CamScanner

3. කොටස - පළාත් පාලන ආයතන සඳහා විශේෂ උපදෙස්

3.1 කසල එක්රැස් කිරීම හා පරිහරණය

3.1.1 පහත දක්වන ලද මාර්ගෝපදේශය අනුව කොවිඩ්-19 ආසාදිතයන් සහිත නිවෙස් හෝ නිරෝධායනය වන පුද්ගලයන් සහිත නිවෙස් ඇතුලත්ව සියළු නිවෙස් වලින් භාවිත කල මුහුණු ආවරණ අඩංගු බෑගයන් පළාත් පාලන ආයතන විසින් එක්රැස් කල යුතුය.

3.1.2. කසල එක්රැස් කරන අවස්ථාවල එම කාර්යයයේ නිරතවන සේවකයන් පෞද්ගලික ආරක්ෂණ උපකරණ (PPE) පැළඳ සිටිය යුතුය.

3.1.3 භාවිත කරන ලද මුහුණු ආවරණ එක්රැස් කොට පිළිස්සීම සඳහා පළාත් පාලන ආයතන විසින් සතියේ විශේෂිත දිනයක් තෝරා ගත යුතුය.

3.1.4. භාවිත කරන ලද මුහුණු ආවරණ අඩංගුවන බෑගයන් ආරක්ෂාකාරී හා නිසි අන්දමට අසුරා නොමැති නම් පළාත් පාලන ආයතන විසින් එම කසල බඳුන් නිවෙස් වලින් එක්රැස් කර ගැනීම නොකළ යුතුය.

3.2 කසල එකතු කරන ලබන සේවකයන්ගේ ආරක්ෂාව සම්බන්ධව පළාත් පාලන ආයතන වගකිව යුතුය.

3.2.1. පළාත් පාලන ආයතනය කසල වල ස්වභාවය පිළිබඳව හා පහත සඳහන් ආරක්ෂාකාරී ක්‍රියාමාර්ගයන් වල අවශ්‍යතාවය සම්බන්ධයන් කසල එක්රැස් කරන්නන්ට නිසි අන්දමට පැහැදිලි කළ යුතුය. පළාත් පාලන ආයතන විසින් කසල එක්රැස් කිරීම, ප්‍රවාහනය, පිළිස්සීම හා අවසාන බැහැර කිරීම දක්වා සිටින සියළුම සේවකයන්ට සුදුසු පුද්ගල ආරක්ෂිත උපකරණ සපයමින් කසල එක්රැස් කරන්නන්ගේ සෞඛ්‍ය රැක ගැනීමට උපරිම පූර්ව ක්‍රියා මාර්ගයන් ගත යුතුය.

3.2.2. කසල එක්රැස් කරන්නන්ට ඔවුන්ගේ දෑත් පිරිසිදු කර ගැනීමට සබන්, විෂබීජ නාශක වැනි පිරිසිදු කාරකයන් සපයා දිය යුතුය. කර්මාන්ත අත්වැසුම්, බූට් සපත්තු හා අපේක්ෂිත ඇඳුම්(ඕවරෝලයන්) සබන් ගා ජලයෙන් පිරිසිදු කිරීමෙන් පසුව නැවත භාවිතයට ගත හැක.

3.2.3. කසල එක් රැස් කරන්නන් විසින් නිවසෙන් නිවසට කසල එක්රැස් කිරීමේදී නිවැසියන් සමග අවම වශයෙන් මීටර් 02ක ශාරීරික දුරස්ථභාවයක් තබා ගන්නා ලෙසට හා හැකි සෑම අවස්ථාවකම තමා සමග එකට වැඩ කරන සේවකයන්අතර නිර්දේශිත ශාරීරික දුරස්ථභාවය තබා ගන්නා ලෙසට උපදෙස් ලබා දිය යුතුය.

3.2.4. කසල එක්රැස් කරන අවස්ථාවල රැස් කිරීමේ කණ්ඩායමට බාහිර පරිසරය සමග ඔවුන්ගේ සම්පර්ීම අවම කරන ලෙසට උපදෙස් ලබා දිය යුතුයි.( තේ/ජලය පානය කිරීම, අහාර ගැනීම, බුලත්විට සැපීම, දුම් පානය හෝ වෙළඳසැල්වලට යාම ආදිය නොකළ යුතු බවට තදින් අවවාද කළ යුතුය.)

Scanned with CamScanner

3.2.5. කසල එක්රැස් කරන අතරතුර හා ඔවුන්ගේ දැත් සෝදන විට මුහුණ හෝ මුහුණු ආවරණ ස්පර්ශ නොකරන ලෙසට ඔවුන්ට උපදෙස් ලබා දිය යුතුය.

3.2.6 එක්රැස් කරන ලද කසල, බැහැර කරන තෙක් අයාලේ යන සුනඛයන් හෝ කසල කන සතුන් ඇතුලත්ව කුරුල්ලන් හා අනෙක් සතුන්ට ලඟාවිය නොහැකි වනසේ ආරක්ෂිතව ගබඩා කළ යුතුය.

3.3. භාවිත කළ මුහුණු ආවරණ අවසාන වශයෙන් බැහැර කිරීම

3.3.1 ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙමින් කරනු ලබන ක්‍රියාකාරකම් වල සියළු පියවරයන් පෞද්ගලිකවම සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රියාමාර්ග අනුගමනය කරමින් කළයුතු වේ. මෙම මාර්ගෝපදේශය අනුව බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන විසින් එක්රැස් කල මුහුණු ආවරණ අඩංගු සියළු බෑගයන් කසල කළමනාකරණ අධිකාරිය මගින් දහනාගාරයකට බාර දිය යුතුය.

3.3.2.
අනෙක් සියළු පළාත් පාලන ආයතන භාවිත කළ මුහුණු ආවරණ පිළිස්සීමට දහනාගාරයක් භාවිත කිරීමට හෝ ඒවා සනීපාරක්ෂකව කුණු කසල දමනු ලබන ස්ථානයකට දැමීමට නිර්දේශ කෙරේ. එවැනි පහසුකම් නොතිබේ නම් හෝ ඒවාට ලඟා විය නොහැකි නම්, භාවිත කළ මුහුණු ආවරණ අඩංගු බෑගයන් මීටර 02කට වඩා ගැඹුරු දැනට කසල දමන වලට වෙන්වූ කොටසක වැලලිය යුතුය.

<u>කමිටු සාමාජිකයන්</u>

| අනු අංකය | නම | තනතුර හා ආයතනය |
|---|---|---|
| 01. | ඉංජි. යූ. ඉන්ද්‍රරත්න මයා | නි.අ. ජනරාල් (කසල කළමනාකරණ), මධ්‍යම පරිසර අධිකාරිය |
| 02. | වෛද්‍ය තිලක් සිරිවර්ධන මයා | නි.අ. ජනරාල් (වැ.බ) (පාරිසරික වෘත්තීය, සෞඛ්‍ය හා ආහාර සුරක්ෂිත) සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 03. | වෛද්‍ය මලික් කරුණාරත්න මයා | ක්ෂුද්‍රජීවී විශේෂඥ වෛද්‍ය/බෝවන රෝග රෝහල (IDH) |
| 04. | වෛද්‍ය ඉනෝකා සුරවීර | විශේෂඥ ප්‍රජා වෛද්‍ය/ පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය අධ්‍යක්ෂ, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 05. | වෛද්‍ය අනුරුද්ධ කරුණාරත්න මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ කෘෂිකාර්මික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම පීඨය. පේරාදෙණිය වි.වි. |
| 06. | එස්.එම්.වේරහැර මහතා | අධ්‍යක්ෂ (පාරිසරික දූෂණ පාලන/රසායන කළමනාකරණය) පරිසර අමාත්‍යාංශය |
| 07. | නලින් මාන්නප්පෙරුම මහතා | අධ්‍යක්ෂ, කසල කළමනාකරන අධිකාරිය, බස්නාහිර පළාත. |

Scanned with CamScanner

| | | |
|---|---|---|
| 08. | සරෝජිනී ජයසේකර මහත්මිය | අධ්‍යක්ෂ, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය |
| 09. | තිස්ස ගමගේ මහතා | අධ්‍යක්ෂ(වැ.බ.) විනාශකාරී කසල හා රසායන කළමනාකරණය, මධ්‍යම පරිසර අධිකාරිය |
| 10. | මහේෂ් ජල්තොට මහතා | සහකාර අධ්‍යක්ෂ, විනාශකාරී කසල හා රසායනික කළමනාකරණය, මධ්‍යම පරිසර අධිකාරිය |
| 11. | සුජීවා ප්‍රනාන්දු මහත්මිය | සහකාර අධ්‍යක්ෂ, පාරිසරික දූෂණ පාලන, රසායනික කළමනාකරණය, පරිසර අමාත්‍යාංශය. |

Scanned with CamScanner